# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

**11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය**

නම/ විභාග අංකයඃ ......................................... කාලය : පැය 3 යි

### I කොටස

- **සැ.යු.-: 1 - 40 දක්වා සියලු ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.**

1) සිදුහත් බෝසතුන්ට සංසාරයෙන් එතෙර වීමට ද දම් අමා වැස්සෙන් ලෝ සතුන් එතෙර කරවීමට ද හැකිවූයේ උන්වහන්සේ,
   i. හොඳින් ශිල්ප ඉගෙනීම නිසා ය
   ii. ගුරුබසට කීකරු වීම නිසා ය
   iii. හොඳ පරම්පරාවකින් පැවතීම නිසා ය
   iv. විමසුම් නුවණින් කටයුතු කිරීම නිසා ය

2) ගිහියා මිත්‍යාවෙන් මුදවා දැහැමි දිවිපෙවතකට යොමු කිරීමත්,ජාතික ව්‍යසන වලදී පිහිට වීමත් ආදී මා හැඟි කාර්යයන් සඳහා ස්වාමීන් වහන්සේලා නායකත්වය ලබාදෙන බැවින් උන්වහන්සේලා හඳුන්වනු ලබන්නේ,
   i. මහා සංඝයා යන නමින් ය
   ii. විහාරාධිපතින් වහන්සේ නමින් ය
   iii. භූසුර දෙවියන් නමින් ය
   iv. මුර දේවතාවන් යනුවෙන් ය

3) ආගන්තුකයන් සඳහා සූදානම් කළා වූ ආහාරය වුවද පිළිගැන්වීමට සුදුසු හෙයින් මහ සඟරුවන,
   i. පාහුණෙය්‍ය නම් වන සේක
   ii. ඒහිපස්සිකෝ නම් වන සේක
   iii. ඕපනයිකෝ නම් වන සේක
   iv. අකාලිකෝ නම් වන සේක

4) පස්කම් සැප පිළිබඳ පුද්ගලයා තුළ ඇති දැඩි කැමැත්ත කාමඡන්දය වේ. මෙම කාමඡන්දය උපමාකර ඇත්තේ ,
   i. උතුරන ජලයටය
   ii. පාට කළ ජලයටය
   iii. බොර ජලයටය
   iv. සෙලවෙන ජලයටය

5) බුදුරජාණන් වහන්සේ ලොව පහළවීමට පෙර සිට භාරතීය යෝගීන් අතර සමථ භාවනාව භාවිතා වූ බව සඳහන් වේ.එකල සිටි සප්ත සමාපත්තිලාභියෙකු වන්නේ,
   i. අසිත තවුසා
   ii. ආලාරකාලාම තවුසා
   iii. උද්දකරාමපුත්ත තවුසා
   iv. සර්වමිත්‍ර බමුණා

6) මිනිසුන් අතර ඇති සාමාන්‍ය ලෝක ව්‍යවහාරය සහ කොටස් වෙන්කර පරීක්ෂා කර බැලීමෙන් පෙනෙන යථාර්ථය වශයෙන් ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇතිකරගත හැකි අවබෝධය දෙයාකාරයය. එනම්,
   i. සම්මුති සත්‍යාවබෝධය හා පරමාර්ථ සත්‍යාවබෝධයයි
   ii. විරතිය හා සමාදානය පිළිබඳ අවබෝධයයි
   iii. ලැජ්ජාව හා බිය පිළිබඳ ඇති අවබෝධයයි
   iv. අනිත්‍ය දුක්ඛ පිළිබඳ අවබෝධයයි

7) උපසම්පදා භික්ෂූන් වහන්සේලා මෙරට නොසිටි කාලයක සරණංකර හිමියන් උපසම්පදාවට පත්වීම සිදුවිය.ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහයෙන් දූත පිරිසක් සියම් රටට යවන ලද්දේ,
   i. ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය කාලයේ ය
   ii. කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය කාලයේ ය
   iii. පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ ය
   iv. තුන්වන විජයබාහු රාජ්‍ය කාලයේ ය

8) මහා සංඝරත්නය කෙරෙහි අසීමිත ගෞරවයක් දැක් වූ දුටුගැමුණු රජතුමා කිසිවිටක භික්ෂූන් වහන්සේලාට නොපිළිගන්වා ආහාර නොගත් බව සඳහන් වේ. මිරිස් ව්‍යංජනයක් භික්ෂූන් වහන්සේලාට නොපිළිගන්වා ආහාරයට ගැනීම නිසා ඒ පාපයෙන් මිදීමට සාදා පූජා කරන ලද්දේ,
   i. ලෝවාමහාපායයි
   ii. මිරිසවැටියයි
   iii. ථූපාරාමයයි
   iv. රුවන්වැලි සෑයයි

9) ධම්ම පද ගාථා අතර මෙලොවදී ම යසස වැඩීමට හේතු වන කරුණු හතක් දේශනා කර ඇති ගාථාවේ මුල් පද දෙක වන්නේ,

i. තංච කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති
ii. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
iii. අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං
iv. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ

10) බුදුන් දවස සීලයෙහි පිහිටා කටයුතු නොකළ නිසා තමන් උපයන ලද සියලු ධනය අහිමි කොටගෙන ඉන ඇඳි වතට පමණක් සීමා වූ සිටුවරයා වූයේ ,

i. සුදත්ත සිටුවරයා
ii. මහධන සිටුවරයා
iii. යසකුල පුත්‍රයා
iv. ඉල්ලීස සිටුවරයා

11) සිගාලෝවාද සූත්‍රයට අනුව නැගෙනහිර දිසාවට හා දකුණු දිසාවට උපමා කර ඇත්තේ පිළිවෙලින් ,

i. ගුරුවරු සහ ස්වාමි භාර්යාවන් ය
ii. මවුපියන් හා ගුරුවරුන් ය
iii. මව්පියන් හා පැවිදි උතුමන් ය
iv. හිත මිතුරන් හා සේව්‍ය සේවකයන් ය

12) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමව්පියන්ගෙන් දූදරුවන්ට ඉටුවිය යුතු යුතුකම් අතරට අයත් නොවන්නේ,

i. ඔවුන් වරදින් මුදවා ගැනීම
ii. ඔවුන් යහපත් කටයුතුවල යෙදවීම
iii. සුදුසුකල්හි සම්පත් පවරා දීම
iv. ගෙදර වගකීම් පැවරීම

13) මිනිසුන්ගේ අංග ලක්ෂණ බලා ඔවුන් හඳුනාගත හැකි ශාස්ත්‍රයක් දැන සිටි බමුණු ආචාර්ය වරයෙක් බුදුරජාණන් වහන්සේ හමුවී සුහදව කතාබහ කළහ.ඒ බමුණු පූජකයා වූයේ,

i. සර්ව මිත්‍ර බමුණා
ii. කසීභාරද්වාජ බමුණා
iii. ද්‍රෝණ බමුණා
iv. සේල බමුණා

14) බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි අන්‍ය ආගමිකයින් සමඟ සුහදව කටයුතු කිරීම,සාකච්ඡා කිරීම,ඔවුන්ගෙන් ගත යුත්තක් ගැනීම,සංශෝධනය කළ යුත්තක් සංශෝධනය කිරීම ආදියෙන් පැහැදිලි වන්නේ උන්වහන්සේ තුළ පැවති,

i. මිත්‍රත්වයයි
ii. ආගමික පරෝපකාරයයි
iii. මෛත්‍රියයි
iv. ආගමික සහජීවනයයි

15) පඤ්ච අභිඥා අෂ්ට සමාපත්ති ආදී ධ්‍යාන උපදවාගෙන ඉන් නොපිරිහී මියගිය විට බ්‍රහ්ම ලෝකවල උපත ලබන්නේ,

i. අහෝසි කර්මයේ ප්‍රතිඵලයක් වශයෙනි
ii. ගරුක කර්මයේ ප්‍රතිඵලයක් වශයෙනි
iii. ආසන්න කර්මයේ ප්‍රතිඵලයක් වශයෙනි
iv. කටත්තා කර්මයේ ප්‍රතිඵලයක් වශයෙනි

16) ''භවත් ගෞතමයන් වහන්ස මේ, මිනිස් ලෝකයෙහි ජීවත් වන අය අතර විවිධ විෂමතා පවතී. සමහරුන්ට ආයුෂ අඩුයි,සමහරුන්ට වැඩියි,සමහරුන්ට ලෙඩ දුක් අඩුයි,සමහරුන්ට වැඩියි '' ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,

i. සුභ නම් මානවකයා ය
ii. සිගාල ගෘහපතියා ය
iii. ඡත්ත මානවකයා ය
iv. මඝ මානවකයා ය

17) බුදුදහමට අනුව හටගැනීමේ ස්වභාවය ඇති සෑමදේම නැතිවීමේ ස්වභාවයෙන් යුක්ත වීම සනාතනික වූ පොදු ධර්මතාවයකි, ඒ අනුව රූපය පෙන පිඩක් වැනි නම් වේදනාව,

i. කෙසෙල් කඳක් වැනි ය
ii. මිරිගුවක් වැනි ය
iii. මායාවක් වැනි ය
iv. දිය බුබුලක් වැනි ය

18) ත්‍රිශික්ෂාවේ සමාධි ශික්ෂාවට අයත් නොවන මාර්ග අංගය වන්නේ,

i. සම්මා වායාම
ii. සම්මා ආජීව
iii. සම්මා සති
iv. සම්මා සමාධි

19) පරලොවක් නැත යන විශ්වාසය මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,

i. කාම තණ්හා
ii. භව තණ්හා
iii. විභව තණ්හා
iv. පොට්ඨබ්බ තණ්හා

20) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩපය බවට කරගත් අවස්ථාවක් ලෙස ගිජ්ජකූට පර්වතයෙහි සූකරකත ලෙන දැක්විය හැකි ය. එහිදී දේශනා කරන ලද සූත්‍රය වන්නේ මේ අතරින් කවරක් ද?

i. වේදනා පරිග්‍රහ සූත්‍රය
ii. තේවිජ්ජ සූත්‍රය
iii. අම්බට්ඨ සූත්‍රය
iv. මහා සීහනාද සූත්‍රය

21) සුදත්ත හෙවත් අනේපිඬු සිටුතුමාට මුලින් ම බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණේ,

i. මකුල පර්වතයෙහි වැඩසිටියදී ය
ii. ජීවක අඹ වනයෙහි වැඩසිටියදී ය
iii. සීත වනයෙහි වැඩසිටියදී ය
iv. ඉච්ඡානංගල වනයෙහි වැඩසිටියදී ය

22) මිනිසුන්ට වැළඳෙන කායික රෝග පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද සේක. එසේ දේශනා කළ සූත්‍රයක් වන්නේ,

i. ගිරිමානන්ද සූත්‍රය
ii. සීහනාද සූත්‍රය
iii. සිගාලෝවාද සූත්‍රය
iv. වේදනා පරිග්‍රහ සූත්‍රය

23) භික්ෂූන් වහන්සේලාට උගන්වා ඇති පරිදි උන්වහන්සේලා දන් වැළඳිය යුත්තේ,

i. පිළිවෙත් පිරීමට උපකාර වනු පිණිස
ii. මද වඩනු පිණිස
iii. කඩවසම් වනු පිණිස
iv. සිරුර සරසාගනු පිණිස

24) වළගම්බා රජුට බලයට පත්වීමට උපකාර කළ මහා තිස්ස හිමියන්ට වළගම්බා රජු විසින්,

i. සෝමාවතිය පූජා කරන ලදී
ii. මහා විහාරය පූජා කරන ලදී
iii. අභයගිරිය පූජා කරන ලදී
iv. ජේතවනය පූජා කරන ලදී

25) කණිෂ්ක රජු දවස භාරතයේ පවත්වන ලද හතරවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ,

i. විශාලා මහනුවර කූඨාගාර ශාලාවේදී ය
ii. විශාලා මහනුවර වාලුකාරාමයේදී ය
iii. පැලලුප් නුවර අශෝකාරාමයේදී ය
iv. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේදී ය

26) මිහින්තලයේ කණ්ඨක චෛත්‍ය නැරඹීමට ගිය අයෙකුට දක්නට ලැබෙන කලාත්මක අතින් උසස්ම නිර්මාණය වන්නේ,

i. බෝධිඝරයයි
ii. පියගැටපෙළයි
iii. වටදාගෙයයි
iv. වාහල්කඩයි

27) ස්තූපයක් නිර්මාණයේදී සලපතළ මළුව තැනීමෙන් පසු අනුගමනය කළයුතු නිවැරදි පිළිවෙළ ලෙස සැළකෙන්නේ,

i. සතරැස් කොටුව, ගර්භය, දේවතා කොටුව, තුන්මහල් පේසාව, කොත් කැරැල්ල, චූඩාමාණික්‍යය
ii. ගර්භය, දේවතා කොටුව, සතරැස් කොටුව, තුන්මහල් පේසාව,කොත් කැරැල්ල, චූඩාමාණික්‍යය
iii. තුන්මහල් පේසාව,ගර්භය ,සතරැස් කොටුව, දේවතා කොටුව, ,කොත් කැරැල්ල, චූඩාමාණික්‍යය
iv. ගර්භය, සතරැස් කොටුව, දේවතා කොටුව, තුන්මහල් පේසාව, චූඩාමාණික්‍යය, කොත් කැරැල්ල

28) විහාර මන්දිරයක හෝ රාජකීය ගොඩනැගිල්ලක දොරටු ඉදිරිපස අර්ධ කවාකාර මුදුන සහිත ගල්පුවරු දෙකක් ඇත. මෙම ගල් පුවරු මධ්‍යයෙහි ත්‍රිභංග ලීලාවෙන් මිනිස් වෙස් ගත් නා රජු නිර්මාණය කර ඇත. මෙම නිර්මාණය,

i. මුරගල ලෙස හැඳින්වේ
ii. සඳකඩපහණ ලෙස හැඳින්වේ
iii. කොරවක්ගල ලෙස හැඳින්වේ
iv. වාහල්කඩ ලෙස හැඳින්වේ

29) පොළොන්නරු යුගයේ විශාලත ම චිත්‍රාවලිය දක්නට ලැබෙන්නේ තිවංක පිළිම ගෙයිනි. මෙහි ගර්භ ගෘහයෙහි ඇති සිතුවම් තුළින් බුද්ධ චරිතයත්, අන්තරාලයේ ඇති සිතුවම් තුළින් ජාතක කථාත් නිරූපණය වේ. මෙම නිර්මාණය කරවන ලද්දේ,

i. පළමුවන විජයබාහු රජු විසිනි
ii. මහා පැරකුම්බා රජු විසිනි
iii. නිශ්ශංකමල්ල රජු විසිනි
iv. ලීලා බිසව විසිනි

30) දස සක්විතිවත් යහපත් රාජ්‍ය පාලනයක් පවත්වාගෙන යාමට උපකාරී වේ. මෙම පිළිවෙත් දහය සඳහන් වන්නේ,

i. චක්කවත්තී සීහනාද සූත්‍රයේ ය
ii. කාලාම සූත්‍රයේ ය
iii. චූල්ලකම්ම විභංග සූත්‍රයේ ය
iv. මහාසීහනාද සූත්‍රයේ ය

31) සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව සඳකඩපහණින් නිරූපණය වන්නේ,

i. සසරින් එතෙර වීමයි
ii. තුනී වූ තණ්හාවයි
iii. සංසාර බය නැතිකිරීමයි
iv. සසර බියෙන් මිදීමයි

32) අනුරාධපුරයේ භික්ෂූන් වහන්සේලාට, පොහොය විනය කර්ම ආදී උපෝසථ කර්ම සිදුකිරීමට දුටුගැමුණු රජු විසින් ඉදිකරන ලද නිර්මාණය වන්නේ,

i. කාලාපාසාද ගොඩනැගිල්ලයි.
ii. හත්හාල්ලක මෙහෙණවරයි.
iii. ලෝවාමහාපායයි.
iv. රත්න ප්‍රාසාදයයි.

33) බුදුබව පතන බෝසත් උතුමන් විසින් පුරනු ලබන උතුම් පිළිවෙත් සමූහය හැඳින්වෙන්නේ,

i. දස රාජධර්ම නමිනි
ii. දස පින් කිරියවත් නමිනි
iii. දස සක්විති වත් නමිනි
iv. දස පාරමිතා නමිනි

34) කෙනෙක් දන් දෙන්නේ කීර්ති ප්‍රශංසා මෙන්ම දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබාගැනීමේ අදහසින් නම් එබඳු දානය,

i. තෘෂ්ණාවෙන් මිශ්‍රය
ii. මිත්‍යා දෘෂ්ටියෙන් මිශ්‍රය
iii. කරුණාවෙන් මිශ්‍රය
iv. මානයෙන් මිශ්‍රය

35) දූරංගම ඒකචරං- අසරීරං ගුහාසයං යන ධම්මපද ගාථාවෙන් දැක්වෙන්නේ,

i. කයෙහි ස්වභාවයයි
ii. සංස්කාර ධර්මවල ස්වභාවයයි
iii. චෛතසිකවල ස්වභාවයයි
iv. සිතෙහි ස්වභාවයයි

36) බුද්ධ,ධම්ම,සංඝ, යන ත්‍රිවිධ රත්නයේ ගුණ අවබෝධ කොටගෙන ඇතිවන ප්‍රසාදය හෙවත් පැහැදීම බුදුදහමේ හැඳින්වෙන්නේ,

i. ආකාරවතී සද්ධා නමිනි
ii. අමූලිකා සද්ධා නමිනි
iii. බැතිමත් බව නමිනි
iv. බුද්ධලම්බනය නමිනි

37) සූත්‍ර, විනය , අභිධර්මය යන ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථ සම්පාදනය විය. ඒ කුමන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසට ද?

i. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකිනි.
ii. අළුවිහාර සංගායනාවේ ප්‍රතිඵලයකනි.
iii. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකිනි.
iv. කණිෂ්ක ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකනි

38) ආරම්භ ධාතු ,නික්කම ධාතු, පරක්කම ධාතු යන එකිනෙකට බලපවත්වන වීර්යයෙහි යෙදී කටයුතු කිරීමෙන්,

i. කාමච්ඡන්දය දුරුවේ
ii. ථිනමිද්ධය දුරුවේ
iii. උද්ධච්ච කුක්කුච්ච දුරුවේ
iv. විචිකිච්ඡාව දුරුවේ

39) බුදුදහමේ උගන්වන අවම ශීල ශික්ෂණය පඤ්ච ශීල ශික්ෂණයයි. එහි ඇතුළත් ශික්ෂාවන් අතර කායික නිරෝගීතාවය පිණිස දැක්වෙන ශික්ෂාවන් වන්නේ,

i. පළමු හා දෙවන ශික්ෂාවන්
ii. දෙවන හා හතරවන ශික්ෂාවන්
iii. තුන්වන හා පස්වන ශික්ෂාවන්
iv. පළමු හා හතරවන ශික්ෂාවන්

40) චුල්ල කම්ම විභංග සූත්‍රයේ සඳහන් පුද්ගල විෂමතා අතර අන් සැපතට ඊර්ෂ්‍යා කිරීම නිසා ඇතිවන විපාකයකි,

i. යසස් ඇති අය වී ඉපදීම.
ii. යසස් නැති අයවී ඉපදීම
iii. පහත් යැයි සම්මත අයවී ඉපදීම
iv. අල්ප භෝග ඇතිව ඉපදීම

(ලකුණු 1× 40 =40)

**11 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය - II කොටස**

**සැ. යු .- පළමු ප්‍රශ්නය අනිවාර්යවේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(1)

i. බුදුසසුනේ ද්වේවාචික උපාසකවරු නම් කරන්න.
ii. බුදුන්වහන්සේ මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න.
iii. බුදුරජාණන්වහන්සේ අරහං නම් වන සේක. එසේ හැඳින්වීමට හේතු දෙකක් ඉදිරිපත් කරන්න.
iv. "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තථාගතෝ ආහ" යන්නෙහි අර්ථය ලියන්න.
v. බුද්ධ කාරක ධර්ම 04 ක් නම් කරන්න.
vi. පටිලෝම පටිච්ච සමුප්පාදයට අනුව **"නාමරූප නිරෝධා සළායතන නිරෝධා"** යන්නනෙහි අදහස කුමක්ද?
vii. පංචස්කන්ධය නාමරූප වශයෙන් කොටස් දෙකකි. ඉන් 'නාම' කොටසට අයත් අංග 02 ක් නම් කරන්න.
viii. පරිසරය ඇසුරු කරගනිමින් බුදුරජාණන්වහන්සේ වස් විසූ ස්ථාන දෙකක් නම් කරන්න.
ix. සිංහලයේ මහා කාව්‍ය වන කව්සිළුමිණ රචනා කිරීමට පාදක කරගත් ජාතක කථාව කුමක්ද? එය රචනාවූ යුගය කුමක් ද?
x. රේරුකානේ චන්ද්විමල හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න. $(2 \times 10 = 20)$

(2)

i. පමණ දැන ආහාර අනුභවය පිළිබඳ බුදුරජාණන්වහන්සේ කොසොල් රජුට දේශනා කළ සූත්‍රය කුමක්ද? (ල.2)
ii. අවිධිමත් ලෙස ආහාර අනුභව කරන පස්දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ. ඉන් තිදෙනෙකු නම් කරන්න. (ල.3)
iii. ආහාර අනුභවයේදී නිරෝගී දිවිපැවැත්ම සඳහා බුදු දහමින් අනුමත ක්‍රියාමාර්ග පැහැදිලිකොට ඒ සඳහා තවදුරටත් සේඛියා ධර්ම ඉවහල්වන ආකාරය විස්තර කරන්න. (ල.5)

(3)

i. සිගාලෝවාද සූත්‍රයේ දේශනාකර ඇති සමාජ කණ්ඩායම් අතරින් බටහිර දිශාව සහ උතුරු දිශාවට අයත් සමාජ කණ්ඩායම් නම් කරන්න. (ල.2)
ii. ඉන් එක් කණ්ඩායමකින් ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න. (ල.3)
iii. අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීමේ අගය කැමති සමාජ කණ්ඩායම් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.5)

(4)

i. අක්කෝච්ඡිමං අවධිමං යනුවෙන් දැක්වෙන ගාථා ද්විත්වයෙන් එකක් සම්පූර්ණ කර ලියන්න.(ල.2)
ii. ඉහත (I) හි ලියන ලද ගාථාවේ අර්ථය ලියන්න. (ල.3)
iii. ශිෂ්‍ය ජීවිත සාර්ථකත්වය සඳහා ධම්ම පද ගාථා උපයෝගී කරගත හැකි ආකාරය විස්තර කරන්න. (ල.5)

(5)

i. ද්වාදසාංග පටිච්ච සමුප්පාදයෙන් අංග දෙකක් නම් කරන්න. (ල.2)
ii. පටිච්ච සමුප්පාද න්‍යාය ලියා දක්වන්න. (ල.3)
iii. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සමාජගත දුක ඇතිවන ආකාරය පැහැදිලි කරන්න. (ල.5)

(6)

i. සිව්වන ථේරවාදී සංගායනාව (පුස්තකාරූඪ සංගීතිය) පැවැත්වූ ස්ථානය හා සහභාගීවූ භික්ෂූන්වහන්සේලා ගණන ලියා දක්වන්න. (ල.2)
ii. එම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු 03 ක් ලියන්න. (ල.3)
iii. ධර්ම විනයෙහි අනාගත සුරක්ෂිතතාවය උදෙසා ධර්ම සංගායනා හේතු වූ ආකාරය පැහැදිලි කරන්න. (ල.3)

(7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. වැලිවිට සරණංකර නාහිමි
ii. ස්ථූපය
iii. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ
iv. පුරිස ධම්ම සාරථී ගුණය

$(5 \times 2 = 10)$